දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

# සිංහ 2.2 - සිංහල නාට්‍ය හා රංග කලාව
# SLG 2.2 - Sinhala Drama and Theatre

කාලය පැය තුන යි

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)

---

## I කොටස

01. "නාට්‍ය වනාහි සම්මිශ්‍රිත කලා මාධ්‍යයකි." මේ කියමන සනිදර්ශන ව පැහැදිලි කරන්න.

02. නාට්‍ය නිෂ්පාදනයේ දී ආලෝකකරණයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

03. නාඩගම් සම්ප්‍රදාය හා සසඳමින් "නූර්ති" නාට්‍ය සම්ප්‍රදායේ පැනෙන විශේෂ ලක්ෂණ පහදන්න.

04. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ ප්‍රමාණවත් විවරණ සපයන්න.
   1. නාට්‍ය ධර්මී රංග ශෛලිය
   2. නාට්‍ය නිෂ්පාදක
   3. වෙස් මෝස්තර නිර්මාණය
   4. සතරවිධ අභිනය

## II කොටස

05. එක්කෝ
"<u>සිංහබාහු</u> නාටකයෙන් මානව සබඳතාවල ඇති ප්‍රබලබව මනා ව පිළිබිඹු කෙරේ." විමසන්න.
නැතහොත්
"<u>සිංහබාහු</u> නාටකය වඩාත් රසවත් වන්නේ යොදාගත් භාෂාවේ ඇති විශේෂත්වය නිසා ම ය." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

06. "භාරතීය නාට්‍ය කලාවේ උපත පිළිබඳ කියැවෙන පුරාණෝක්තිවලින් එහි පෞරාණිකත්වයත්, පූජාර්ථයත් ප්‍රකට වේ." විමසන්න.

07. "මූලාශ්‍රයයෙහි නොමැති අවස්ථා නිරූපණ නාට්‍යෝචිත ව යොදා ගැනීම කාලිදාසයන්ගේ <u>ශකුන්තලා</u> නාට්‍යයෙහි සාර්ථකත්වයට එක් හේතුවක් විය." සනිදර්ශන ව විමසන්න.

08. <u>රත්නාවලී</u> නාට්‍යයේ ස්ත්‍රී චරිත නිරූපණයෙහි විශේෂතා වාසවදත්තා හා සාගරිකා යන චරිතද්වය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 20 බැගිනි)

⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛⊛